

ඡායාරූපය - ස්ටූඩියෝ ටයිම්ස් ලිමිටඩ්

# ජාතික සංවර්ධනයට සහ සැලසුම්කරණයට දේශගුණික විපර්යාස අනුගත කිරීම

සාමයේ අරුණළු සමඟ ශ්‍රී ලංකාව සංවර්ධනයේ නව මංපෙත් වෙත පියමන් කරමින් සිටී. ඉදිරි දශකය තුළදී ශ්‍රී ලංකාව තුල දරිද්‍රතාවය මැඩ පැවැත්වීමට සහ මධ්‍ය ආදායම් රටක් ලෙස තහවුරු වීම සඳහා සියළුම ක්ෂෙත්‍ර වල නව ආයෝජන සිදුකරනු ඇත. මේ වෙනුවෙන් ප්‍රබල ජාතික සංවර්ධන ඉලක්ක සකස් කොට ඇත.

මිනිසාගේ අයහපත් ක්‍රියාවල ප්‍රතිඵලය නිසා සිදුවන මිහිතලය උණුසුම් වීම සහ ඇතිවෙන දේශගුණ විපර්යාසවල බලපෑමෙන් අපේක්ෂිත සංවර්ධන සැලසුම් අඩාලවිය හැක. එසේ වුවහොත් දැනට පවතින ආර්ථික සහ සමාජීය ආර්ථික විෂමතාවයන් තවදුරටත් පුළුල් වනු ඇත. අපි දැනටමත් දේශගුණ විපර්යාසවල සමහර බලපෑම් අත්දකිමින් සිටින්නෙමු. ඉදිරි දශකය තුලදී වඩාත් ප්‍රබලව මෙය අපට දැනෙනු ඇතැයි විශ්වාසයක් ගොඩනැගෙමින් පවතී.

එවැනි බලපෑම් ඇතිවුවද අපගේ සංවර්ධන න්‍යායපත්‍රය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා සියළුම ආර්ථික සහ සමාජීය ක්ෂෙත්‍ර දේශගුණ විපර්යාසවල බලපෑමට ඔරොත්තු දෙන ලෙස ශක්තිමත් කිරීමේ ඒකාබද්ධ ප්‍රවේශයක අවශ්‍යතාවය මතුව තිබේ. ඒ අනුව දේශගුණ විපර්යාසවලට හැඩගැසීම සඳහා දැනුම, තාක්ෂණය සහ සූක්ෂම සැලසුම්කරණය අවශ්‍ය වනු ඇත.

දේශගුණ විපර්යාස වලට අනුවර්තනය වීම සඳහා ශ්‍රී ලංකාවේ ධාරිතාවය ශක්තිමත් කිරීම.

දේශගුණ විපර්යාස වලට අනුවර්තනය වීම සඳහා වූ ජාතික ක්‍රමෝපායයන්:

උපාය මාර්ග **#1**

# තේමා

දේශගුණ විපර්යාසවල බලපෑම අනාගතයේදී විවිධ පුද්ගලයන්ට විවිධාකාරයෙන් දැනෙනු ඇත. කිසිම පුද්ගලයෙකුට, සමාජයකට හෝ ක්ෂෙත්‍රයකට මෙම අවදානම මග හැර යා නොහැකි වනු ඇති අතර මෙය සාමූහිකව බෙදා හදාගතයුතු අර්බුදයක් බවට පත්වනු ඇත. එමගින් ජනතාව සහ ආර්ථික සම්බන්ධතා ආරක්ෂා කිරීමට නම් දේශගුණ විපර්යාස ක්‍රමයෙන් ඉස්මතු වන්නාවූත්, සියළුම ක්ෂෙත්‍රවලට තර්ජන එල්ල කරන්නාවූත් සංසිද්ධියක් බව සැලකිල්ලට ගත යුතුය. එසේම ජාතික සංවර්ධනයට සහ සැලසුම්කරණයට දේශගුණික විපර්යාස වලට අනුවර්තනය වීම අනුගත කිරීම ඉක්මනින්ම කල යුතුවේ.

දේශගුණ විපර්යාස වලට අනුවර්තනය වීම සඳහා වූ ක්‍රමෝපායයන් සැකසීමේදී විවිධ පාර්ශවකරුවන්ගෙන් තොරතුරු විමසන ලදී. මෙහිදී ප්‍රමුඛත්වය ලබා දිය යුතු ගැටළු සහ ප්‍රතිචාර හඳුනාගත් අතර ඒවා මූලික තේමාවන් 5 ක් යටතේ වර්ග කරණ ලදී.

## දේශගුණ සාධනය සහිත ආර්ථික සැලසුම්කරණය

දේශගුණ විපර්යාසවල ආර්ථිකයමය පසුබිම පිළිබඳ අවබෝධය ශ්‍රී ලංකාව තුල සීමිතය. දේශගුණ විපර්යාස පිළිබඳ කෙතරම් කථාබහ ඇති වුවද එහි බලපෑමෙන් ජනතාව හෝ ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා පවතින්නේ ඉතා සීමිත නීති රෙගුලාසි කිහිපයක් පමණි.

උදාහරණයක් ලෙස පාරිසරික තක්සේරු වාර්තාව (EIA) හෝ ක්‍රමෝපායික පාරිසරික බලපෑම් තක්සේරු (SEA) වාර්තාවේ දේශගුණ විපර්යාස පිළිබඳව සෘජු සැලකිල්ලක් දක්වා නොමැත. මේවා බොහෝවිට වැදගත් ආයෝජන සඳහා ක්‍රියාත්මක වන පාරිසරික විපරම් ලැයිස්තු පමණි. ආර්ථිකයේ විවිධ ක්ෂෙත්‍ර (EIA) / (SEA) මත පදනම්ව පාරිසරික තිරසාර බව සඳහා මාර්ගෝපදේශණ ලබාගනියි.

## දේශගුණ විපර්යාස වලට අනුවර්තනය වීම සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මට්ටමේ ධාරිතාවය ශක්තිමත් කිරීම.

පාරිසරික අමාත්‍යංශය යටතේ පවතින දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය, දේශගුණ විපර්යාසවලට අනුවර්තනය වීම, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කිරීමට බලයලත් ආයතනය වේ. දේශගුණ විපර්යාසවලට අනුවර්තනය වීමේදී බිම් මට්ටමේ ක්‍රියාකාරකම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම විවිධ ක්ෂෙත්‍ර නියෝජනය කරන ආයතන හරහා සිදුකල යුතුවේ. එහෙත් වර්තමාන තත්වයන්ට අනුව දේශගුණ විපර්යාසවල බලපෑම අවම කිරීම සඳහා ක්‍රියාත්මක වීමට ලේකම් කාර්යාලයට සහ අනෙකුත් අදාළ ආයතන වල ට ඇති හැකියාව සීමිතය. රජය තුල මෙන්ම රජයෙන් පිටස්තරවද එම කටයුතු කල හැකි නායකයින් සහ වෘත්තිකයින් මෙරටින් බිහිකිරීමේ අවශ්‍යතාවයක් මේ නිසා ඉස්මතු වේ.



ඡායාරූපය - ස්ටුඩියෝ ටයිම්ස් ලිමිටඩ්

## තේමා



ඡායාරූපය - ස්ටූඩියෝ ටයිම්ස් ලිමිටඩ්

### අනාගත ආයෝජන සහ ආර්ථික සැලසුම් දේශගුණික විපර්යාසවලට මුහුණදිය හැකි බවට සහතික වීම.

ආර්ථික සැලසුම් සකස් කිරීමේදී දේශගුණික විපර්යාස පිළිබඳ සැලකිලිමත් වීමක් මෙතෙක් සිදුවී නොමැත. බොහෝ සැලසුම් සකස් කරන්නන් දේශගුණික විපර්යාස පිළිබඳ දැනුවත්ව වුවද, ඔවුන්ට ඒ සඳහා ගත යුතු අනුවර්තන ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධයක් නොමැති බව පෙනීයයි. දේශගුණික විපර්යාස පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය දැනට සකස් කොට ඇති අතර එමගින් ආර්ථික ක්‍රියාවලිය තුල දේශගුණික විපර්යාස පිළිබඳ සැලකිලිමත් විය යුතු ආකාරය පිළිබඳ අවබෝධයක් සහ මාර්ගෝපදේශණයක් ලබා දී ඇත. ශ්‍රී ලංකාව හරිතාගාර වායු කුඩා ප්‍රමාණයක් පිට කරන නිසා දේශගුණික විපර්යාස අවම කිරිම සඳහා සීමිත දායකත්වයක් ඇති රටක් ලෙස පාර්ශවකරුවන් හඳුනාගෙන තිබේ. මේ නිසා අපේ වැඩි අවධානය දේශගුණික විපර්යාස වලට අනුවර්තනය වීම කෙරේ යොමුවිය යුතු අතර, සිදුවන හානියෙන් ආරක්ෂා වීම සඳහා වැඩිපුර සම්පත් සහ ක්‍රියාමාර්ග ආයෝජනය කලයුතුය.

### දේශගුණික විපර්යාස වලට අනුවර්තනය වීමේ විකල්ප පිළිබඳව විධිමත් පර්යේෂණ

දැනට, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනය, විශ්ව විද්‍යාල සහ වෙනත් රාජ්‍ය නොවන සංවිධාන විධිමත් සම්බන්ධීකරණයකින් තොරව දේශගුණික විපර්යාස පිළිබඳ අධ්‍යයන කටයුතු සිදු කරමින් සිටී. මෙම ආයතන අතර සම්බන්ධීකරණය සහ තොරතුරු හුවමාරුව අවම තත්වයක පවතී. එම නිසා දේශගුණික විපර්යාස වලට අදාළ අධ්‍යයන කටයුතු සැලසුම් කිරීමේදී, අදාළ දැනුම හා තොරතුරු හුවමාරු කරගැනීමේදී, සහ බෙදාහැරීමේදී මීට වඩා යහපත් සම්බන්ධීකරණ පිළිවෙතක අවශ්‍යතාවයක් පවතියි.



ඡායාරූපය - ස්ටූඩියෝ ටයිම්ස් ලිමිටඩ්

### දේශගුණික විපර්යාසවල බලපෑම් වලින් ශ්‍රී ලංකාව ආරක්ෂා කරගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නංවාලීම

ප්‍රවේශය විධිමත් වුවහොත් දේශගුණ විපර්යාස වලට අනුවර්තනය වීම සඳහා ජාත්‍යන්තර සම්පත් ආකර්ෂණය කරගැනීමේ හැකියාව ශ්‍රී ලංකාවට තිබේ. මේ සඳහා මුදල් අමාත්‍යංශයේ මාර්ගෝපදේශකත්වය මෙන්ම විවිධ ක්ෂෙත්‍ර සහ ආයතන නියෝජනය කරන තාක්ෂණික විශේෂඥයින්ගේද සාමූහික ප්‍රයත්නයක් අවශ්‍ය වේ. ලබාගන්නා මූල්‍ය ප්‍රතිපාදන නිවැරදිව බෙදා දීමට, කළමනාකරණය කිරීමට සහ අධීක්ෂණය කිරීම සඳහා සුදුසු ආයතනික යාන්ත්‍රණයක් සැකසීමද අවශ්‍ය වේ.

### දේශගුණ විපර්යාස සඳහා අනුවර්තනයට සහය ලබාගැනීම වෙනුවෙන් විවිධ තරාතිරම් වල පාර්ශවකරුවන් සජීවිකරණය සහ දැනුවත් කිරීම

අධ්‍යාපන පද්ධතිය, ජන මාධ්‍ය සහ අනෙකුත් තොරතුරු ප්‍රචාරණය කරන්නන් ආශ්‍රයෙන් දේශගුණ විපර්යාස වලට අනුවර්තනය වීමේ දැනුම සහ අවබෝධය සමාජයේ සියළුම ක්ෂෙත්‍ර වෙත සන්නිවේදනය කළයුතුය. සන්නිවේදන ක්‍රමවේද තුලින් උපරිම ඵල ලබාගැනීමට නම්, ප්‍රේක්ෂකයින් කවරහුද? දිය යුතු පණිවුඩය කුමක්ද? යන්න ඉතාමත් නිවැරදි ලෙස හඳුනාගතයුතු වේ. ඒ, "එකම දේ සෑමදෙනාටම එකසේ සුදුසු නොවන නිසාවෙනි." ඊට අමතරව, එවැනි සාමාන්‍ය දැනුවත් කිරීම් වලින් ඔබ්බට යමින්, අනුවර්තනය සඳහා වන සුවිශේෂී තාක්ෂණික දැනුම, ප්‍රජා සහ ප්‍රාදේශීය මට්ටමේ කළමනාකරුවන් ඉලක්ක කරගනිමින් ප්‍රවර්ධනය කිරීමද අවශ්‍ය වේ.



ඡායාරූපය - ස්ටූඩියෝ ටයිම්ස් ලිමිටඩ්

**අවිනිශ්චිත දේශගුණ විපර්යාස සමඟ ජීවත් වීම හැරෙන්නට වෙනත් විකල්පයක් නොපෙනේ. එම නිසා ශ්‍රී ලංකාවද දේශගුණ විපර්යාස වල බලපෑම්වලට අනුව හැඩගැසීම අනිවාර්යයෙන්ම සිදුකල යුතුවේ. එමඟින් අප රටෙහි ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය බාධාවකින් තොරව අඛණ්ඩව සිදුකරගෙන යාමට අවස්ථාව සැලසෙනු ඇත. එවිට දුප්පත්කම අවම කිරීම, ආහාර හා ජල සුරක්ෂිත බව සහ මහජන සෞඛ්‍ය නංවාලීම සඳහා සිදුකරන ආයෝජනයන් ආරක්‍ෂා කරගතහැකි වේ.**

මෙම පත්‍රිකාව ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රහය සහ තාක්‍ෂණික සහය වෙනුවෙන් වූ ADB TA 7326 SRI:
***දේශගුණ විපර්යාස වලට මුහුණදීම සඳහා ශ්‍රී ලංකාවේ ධාරිතාවය නංවාලීමේ ව්‍යාපෘතිය* මඟින් සකස් කරන ලදී.**

ආසියානු සංවර්ධන බැංකුව පාරිසරික අමාත්‍යංශය සමඟ ක්‍රියාත්මක කල මෙම ව්‍යාපෘතිය තිරසාර ආර්ථික සංවර්ධනය අඛණ්ඩව සිදුකරගෙන යන අතරතුරම දේශගුණික විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ජාතික ක්‍රමෝපාය සම්පාදනය කරන ලදී. එය අනුමත වූ විට ඵලදායී පරිසර කළමණාකරණයක් සහ වඩා විධිමත් ලෙස සංවිධානය කරගත් පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයද ඒකරාශී කරගනිමින් දේශගුණික විපර්යාස සඳහා අනුවර්තනය ලඟා කරගත හැකිවේ.

**වැඩි විස්තර සඳහා සම්බන්ධ විය යුත්තේ**
**දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය, පරිසර අමාත්‍යංශය,**
පලමු මහල, 980/4A  වික්‍රමසිංහ පෙදෙස, ඇතුල් කෝට්ටේ, ශ්‍රී ලංකාව.
දුරකථන: +94 11 2883 481 සහ  +94 11 2883 368
වෙබ් අඩවිය: http://www.climatechange.lk/adaptation/